අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

G. C. E. Ordinary Level | අ. පො. ස. සාමාන්‍ය පෙළ | 2022 (2023)

# Student Seminar Series

# ශිෂ්‍ය සම්මන්ත්‍රණ මාලාව

Practice Paper | උපකාරක ප්‍රශ්න පත්‍ර

# Dancing(Oriental)

# නැටුම් (දේශීය)



Answer Sheet - I, II | පිළිතුරු පත්‍රය - I, II (සිංහල මාධ්‍යය)

Nenasa

මෙහෙයවීම : දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන ශාඛාව | අන්තර්ගතය : සෞන්දර්යය ශාඛාව

## I කොටස - පිළිතුරු

| ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය |
|---|---|---|---|---|---|---|---|
| 01 | 2 | 11 | 2 | 21 | 1 | 31 | 1 |
| 02 | 3 | 12 | 4 | 22 | 2 | 32 | 3 |
| 03 | 4 | 13 | 2 | 23 | 4 | 33 | 2 |
| 04 | 1 | 14 | 1 | 24 | 3 | 34 | 3 |
| 05 | 2 | 15 | 2 | 25 | 2 | 35 | 4 |
| 06 | 4 | 16 | 4 | 26 | 1 | 36 | 1 |
| 07 | 3 | 17 | 3 | 27 | 1 | 37 | 2 |
| 08 | 4 | 18 | 1 | 28 | 3 | 38 | 4 |
| 09 | 1 | 19 | 4 | 29 | 4 | 39 | 3 |
| 10 | 2 | 20 | 3 | 30 | 2 | 40 | 1 |

විශේෂ උපදෙස් - එක් පිළිතුරකට ලකුණු 01 බැගින්

මුළු ලකුණු 1 X 40 = 40

## II කොටස - පිළිතුරු

01) ලකුණු

| | | |
|---|---|---|
| (i). | නාට්‍ය ශාස්ත්‍රය | 1 |
| (ii). | පරයා | 1 |
| (iii). | කුදංත ගත දොං | 1 |
| (iv). | චිත්‍ර | 1 |
| (v). | පුංග් | 1 |
| (vi). | ජයසේන කෝට්ටේගොඩ | 1 |
| (vii). | කොහොඹා කංකාරිය | 1 |
| (viii). | අර්නෝලිස් ඉඹුල්ගොඩ | 1 |
| (ix). | (අ). පෝෂ්වාන් | 1 } 2 |
| | (ආ). මයිකුම් | 1 |
| (x). | (අ). රජයේ ලලිත කලායතනය | 1 } 2 |
| | (ආ).සංස්කෘතික දෙපාර්තමේන්තුව | 1 |

(i)සිට (viii)දක්වා පිළිතුරකට ලකුණු 01 බැගින් - ලකුණු 08
(ix)සිට (x) දක්වා පිළිතුරකට ලකුණු 02 බැගින් - ලකුණු 04
**මුළු ලකුණු (8 + 4) = 12**

02) (i) මාත්‍රා 4+3උඩරට හෝ පහතරට හෝ සබරගමු සම්ප්‍රදායට අයත් බෙර පදයක් ප්‍රස්තාර කරන්න.

උඩරට

| ^ | | | / | | | | ^ | | | / | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 1 | 2 | 3 | 4 |
| දෝං | - | - | ජිං | - | ජිං | - | ත | ක | ට | දොං | - | ත | ක |

පහතරට

| ^ | | | / | | | | ^ | | | / | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 1 | 2 | 3 | 4 |
| ගුං | - | ද | ගත් | - | ග | ත | ගත් | - | ත | ගුග් | - | ගු | ද |

සබරගමු

| ^ | | | / | | | | ^ | | | / | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 1 | 2 | 3 | 4 |
| කු | දත් | - | තත් | - | කි | ට | ත | ක | ට | ජී | මි | ත | ක |

විභාගකර දැක්වීම හා සංකේත සඳහා - ලකුණු 02
බෙර පද ප්‍රස්තාර කිරීමට - ලකුණු 02
**ලකුණු 04**

(ii) . පහත දැක්වෙන කවි පද කොටස මාත්‍රා 2 + 3තාල රූපයට ප්‍රස්තාර කරන්න .

" පානා අසිරි නොහැර පානා දෙනෙත් කුසුම..."

| ^ | | / | | | ^ | | / | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 1 | 2 | 3 | 1 | 2 | 1 | 2 | 3 |
| පා<br>පා | -<br>- | නා<br>නා | -<br>- | අ<br>දෙ | සි<br>නෙත් | රි<br>- | නො<br>කු | හැ<br>සු | ර<br>ම |

විභාගකර දැක්වීම හා සංකේත සඳහා - ලකුණු 02
බෙර පද ප්‍රස්තාර කිරීමට - ලකුණු 02
**ලකුණු 04**

iii. සිංහරාජ වන්නමේ අඩව්ව හෝ අනුරාගදණ්ඩ තාලය සින්දු වන්නමේ ඉරට්ටිය හෝ විරාඩි වන්නමේ අඩව්ව ප්‍රස්තාර කරන්න.

උඩරට අඩව්ව

| / | | | | / | | | | / | | | | / | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 |
| තාම් | - | - | දො | මි | ති | ග | ත | දො | මි | කි | ට | කඩ | තක | තරි | කිට |
| කි | ත | ක | දො | මි | ති | ග | ත | කිත් | - | තත් | - | කු | ද | කු | ද |
| තා | - | කු | ජිත් | - | ත | ග | ත | දො | මි | කි | ට | තරි | කිට | කුන් | දත් |
| තා | - | | | | | | | | | | | | | | |

පහතරට ඉරට්ටිය

| / | | | | / | | | | / | | | | / | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 |
| ත | ක | දිත් | - | ත | ක | දොම් | - | කිත් | - | තත් | - | කි | ටි | ත | ක |
| ත | රි | ග | ත | දි | කු | දොම් | - | දොම් | - | ත | දොම් | - | ත | ග | ත |
| ත | කු | තත් | - | ගුහි | තිග | දිරි | කිට | තා | | | | | | | |

සබරගමු අඩව්ව

| / | | | | / | | | | / | | | | / | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 |
| ගත් | - | ත | කු | ජිත් | - | තත් | - | දොං | ගඩ | තරි | කිට | ජිත් | - | කුන් | - |
| දොං | - | කු | ද | ග | ත | කු | ද | තත් | කඩ | ජික් | කඩ | දොං | ගඩ | තරි | කිට |
| දොං | - | ත | දොං | - | ත | ග | ත | ග | ති | ග | ත | දිමි | කිට | තරි | කිට |
| තා | - | - | ජි | මිත් | - | තත් | - | ග | ති | ග | ත | හර් | ජිත් | ගත | කුද |
| තා | | | | | | | | | | | | | | | |

විභාගකර දැක්වීම හා සංකේත සඳහා - ලකුණු 02
ඉරට්ටිය/ අඩව්ව ප්‍රස්තාර කිරීමට - ලකුණු 02
ලකුණු 04
**මුළු ලකුණු 12**

03) .පහත සඳහන් මාතෘකා අතුරින් තුනක් පිළිබඳව කෙටි සටහන් ලියන්න

(i). වන්නම්

- උඩරට, පහතරට හා සබරගමු නර්තන සම්ප්‍රදායන් ත්‍රිත්වයටම පොදු බව
- අතීතයේ වන්නම් ගායනය සඳහා නිර්මාණය වී ඇති බව
- උඩරට වන්නම් මහනුවර යුගයේ දි, පහතරට සිංදු වන්නම් දෙවුන්දර උපුලවන් දේවාලයේදී හා සබරගමු වන්නම් රත්නපුර සමන් දේවාලයේදී ගායනය කළ බව
- විවිධ වස්තූන්, දෙවියන්, ස්වභාව සෞන්දර්ය වර්ණනා කර ඇති බව
- උඩරට වන්නම් 18ක්/ පහතරට සිංදු වන්නම්32ක්/ සබරගමු වන්නම් 21 ඇති බව

  උදා:- උඩරට - සිංහරාජ, මුසලඩි
  පහතරට - ලලිතරාගතාලය, නාතිලිංචි තාලය
  සබරගමු - විරාඩි, මණ්ඩූක වන්නම්

(ii). නමස්කාර ගාථා

- ත්‍රිවිධරත්නය කෙරෙහි භක්තිපූර්වකව කෙරෙන ගායනා විශේෂයක් බව
- අනාඝාතාත්මකව ගායනය කිරීම විශේෂ ලක්ෂණයක් බව
- සුභ කටයුක්තකදී ගායනය කිරීම සිංහල බෞද්ධ ජනයාගේ ලක්ෂණයක් බව
- භක්තිය, ගෞරවය ඇතිව විලම්භව ගායනය කරන බව
  උදා:- මේරුන් විරාජිත සමං විය බුද්ධ රාජං

(iii). මිරැන්ඩා හේමලතා මහත්මිය

- දේශීය මුද්‍රා නාට්‍ය කලාවට සුවිශේෂ මෙහෙවරක් කළ බව
- කොළඹ ක්‍රමය යටතේ ශිෂ්‍යත්වයක් ලැබ භාරතයට ගොස් භරත නාට්‍යම් ප්‍රගුණ කළ බව
- අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රථම නර්තන අධ්‍යක්ෂ ධූරය හෙබ වූ බව
- "තන්හා ආශා" මුද්‍රා නාට්‍ය හා "රංගරේඛා නූපුර රාවය" යන නර්තන ප්‍රසංග පැවැත් වූ බව
- 1980 වර්ෂයේ දී මෝල්ගස් නැටුම වේදිකාව සඳහා නිර්මාණය කළ බව
- විශේෂ අවශ්‍යතා දරුවන් සඳහා "දිරි දරු පියස" නම් ආයතනය පවත්වාගෙන යන බව
- නර්තන කලාව වෙනුවෙන් කරන ලද සේවය වෙනුවෙන් සෞන්දර්ය කලා විශ්ව විද්‍යාලය මඟින් ආචාර්ය උපාධියෙන් පිදුම් ලැබූ බව

(iv). අංග රචනය

- නර්තනයකට හෝ චරිතයකට අවශ්‍ය පරිදි අංග, වර්ණ හා හැඩතල උපයෝගී කර ගනිමින් හැඩ ගැන්වීම අංග රචනය බව
- අංග රචනයේ විධි ක්‍රම හතරක් ඇති බව
  - ස්වභාවික අංගරචනය
  - චරිතාත්මක අංග රචනය
  - ශෛලිගත අංග රචනය
  - විකාරරූපී අංග රචනය
- අංග රචනය සඳහා භාවිත ද්‍රව්‍ය
  - මූලික ආලේපන (Base make up – Pan cake)
  - ආලේපන පැන්සල් (Make up pencils)
  - රේඛා ඇඳීම (Lining Colours)
  - බුරුසු හා ස්පොන්ච් භාවිතය (Brushes & Sponges)
  - පවුඩර් භාවිතය (powder/ powder Puff)

(v). කරදිය මුද්‍රා නාට්‍යය

- 1961 දී චිත්‍රසේන ඩයස් මහතා විසින් නිර්මාණය කළ බව
- ධීවර ජනතාවගේ දුක් ගැහැට තේමා කරගත් නාට්‍යක් බව
- සිසී, චන්ද, මණ්නඩිරාළ ආදී චරිත හඳුනාගත හැකි බව
- දේශීය, භාරතීය හා බැලේ නර්තන චලන භාවිත කර ඇති බව
- රංග වස්ත්‍රාභරණ, පසුබිම් අලංකරණය, ආලෝකකරණය උචිත පරිදි මතු කර දක්වා ඇති බව

මෙයින් මාතෘකා තුනක් තෝරාගෙන කෙටි සටහන් ලියා ඇත්නම් **මුළු ලකුණු (4x3) = 12**

04) .දේශීය ශාන්ති කර්ම පිළිබඳ විමසීමේ දී පූජාවිධි රටාවේ අන්තර්ගත පොදු ලක්ෂණ මෙන්ම අනන්‍යතා ලක්ෂණ ද පිළිබිඹු වේ.

(i). පහන් මඩුවේ අන්තර්ගත චාරිත්‍රවිධි දෙකක් නම් කර කෙටියෙන් හඳුන්වන්න.

- කප් සිටු වීම.
  - කප් සිටුවා තෙමසක් ගත වීමට පෙර ශාන්ති කර්මය පවත්වන බවට දෙවියන් ඉදිරියේ පොරොන්දු වීම මෙහි දී අර්ථ ගන්වන බව
  - කිරි ගසක අත්තක් ගෙන සුභ නැකතකට අනුව සිටුවා පොල් මලක් හා පඩුරක් ගැට ගැසීම.
- මඩු පේ කිරීම
  - දිගින් 60 රියනක් හා පළලින් 30 රියනක් අනුව ශාන්ති කර්මයට අවශ්‍ය මඩුව සකසා දෙවියන් සඳහා කැපකිරීම
- තොට පේ කිරීම
  - ශාන්ති කර්මයට අවශ්‍ය ජලය ලබාගන්නා ස්ථානය ගොප් රුහැන් ඇද, දෙවියන් සඳහා වෙන් කිරීම.

චාරිත්‍ර දෙකක් නම් කිරීමට - ලකුණු 02
කෙටියෙන් හඳුන්වා ඇත්නම් - ලකුණු 02
**ලකුණු 04**

(ii). දෙවොල්මඩු ශාන්තිකර්මයට පමණක් ආවේණික වූ ගායනය සහිත නර්තන අංගයක් නම්කර, එය විස්තර කරන්න.

- තෙල්මේ, දෙවොල්, යහන් දැක්ම, හත් පද පෙළපාලිය, පත්තිනි නර්තනය, පන්දම් පද, තොරන් යාගය.........නම් කිරීම.
- තෙල්මේ
  - පහතරට නර්තන සම්ප්‍රදාය තුළ දක්නට ලැබෙන ශාස්ත්‍රීය සමූහ නර්තන අංගයක් බව.
  - තෙල්මේ නමින් රංග වස්ත්‍රාභරණ කට්ටලයක් ඇති බව
  - තෙල්මේ නර්තනයේ දී පද 7 ක් නර්තනය කරන බව
  - සුරල් පැඟීම හා තුටු පඬුරු ලබා ගැනීම. චාරිත්‍රයක් ලෙස සිදු කරන බව
- දෙවොල්
  - පහතරට නර්තන සම්ප්‍රදාය තුළ දක්නට ලැබෙන ශාස්ත්‍රීය සමූහ නර්තන අංගයක් බව.
  - දෙවොල් පද 7ක් හා සුරල් පද 7ක් නර්තනය කරන බව
  - දෙවොල් දෙවියන්ගේ ඇඳුම් කට්ටලයට සමාන රංගවස්ත්‍රාභරණයක් ඇති බව
- හත් පද පෙළපාලිය
  - පද 7ක් ඇතුලත් වන මෙම නර්තනාංගයෙන් සෙත් පැතීමක් සිදු කරන බව
  - ආරම්භයේ කෙටි කවි හා නියමිත තාල රූපවලට අනුව කවි ගායනා සිදු කරන බව
  - ගායනා සහිත නර්තනාංගයක් බව

උදා - කෙණ්ඩි පාලිය, තැඹිලි පාලිය ..................

නර්තනාංගයක් නම් කිරීමට - ලකුණු 01
එය විස්තර කර ඇත්නම් - ලකුණු 03
**ලකුණු 04**

(iii). කොහොඹාකංකාරි ශාන්තිකර්මයේ කතා පුවතෙන් පිළිබිඹු වන මානව ගුණධර්ම පිළිබඳ ඇගයීමක් කරන්න.

- වෛර නොකිරීම
- කළගුණ දැක්වීම
- අඹු සැමි විශ්වාසය ඇතිවීම
- පොරොන්දු කඩ නොකිරීම
- පවුල් සංස්ථාව රැක ගැනීම

ඉහතින් දක්වා ඇති මානව ගුණධර්ම පිළිබද ඇගයීමක් කර ඇත්නම් ලකුණු 04

**මුළු ලකුණු 12**

05).

(i). සිංහල ගැමි නැටුමේ එන කළ ගෙඩි නැටුමට සමාන ද්‍රවිඩ ගැමි නැටුම නම් කර ඒ පිළිබඳ ව කෙටියෙන් පැහැදිළි කරන්න.

කළගෙඩි = සෙම්බු

- රංග භාණ්ඩය ලෙස සෙම්බුව භාවිත කරන බව
- ද්‍රවිඩ කාන්තාවන් විසින් සෙම්බුවට දිය පුරවා හිස මත තබා රැගෙන යාම සිරිතක් බව
- පසුබිම් සංගීතයට අනුව ලාස්‍ය ලක්ෂණ මතුවන සේ චලන ඉදිරිපත් කරන බව
- සෙම්බුව අතින් අතට මාරු කිරීම, උඩ දමා ඇල්ලීම මගින් විවිධ හැඩ මතු වන බව
- සාරියෙන්, දිග සායකින් හා හැට්ටයකින් සැරසී නර්තනය කරන බව
- විනෝදාස්වාදය සඳහා නර්තනය කරන බව

ද්‍රවිඩ ගැමි නැටුම නම් කිරිමට - ලකුණු 02

කෙටියෙන් පැහැදිළි කර ඇත්නම් - ලකුණු 02

**ලකුණු 04**

(ii). ගැමි නැටුම් හා සම්බන්ධ ගායනාවලින් පිළිබිඹු වන ඇදහිළි හා විශ්වාස පිළිබඳ ව උදාහරණ දෙකක් ගෙන විස්තර කරන්න.

- ආගමික විශ්වාස මනාව ගැබ්ව පවතින බව
  - “පළමුව බුද්ධං සරණේ නමකර දෙවනුව ධම්මං සරණේ නමකර........”
  - “බෝ අත්තට වැඳ සිරස නමන්නේ....”
  - “ගණ දෙවියන්ගේ කෝවිල ගවා..... .”
  - “වරම් වරම් ශක්‍ර මහ බඹු අතින් වරම්...... .”
- හිරු සඳු දේවත්වයෙහිලා සැලකීම
  - “වරම් වරම් ඉර සඳ දෙවි අතින් වරම්....”
  - “උදයට පායන හිරු දෙවියන්ටයි...”
  - “සූරිය කුල ඇති හිරු දෙවියන්නේ..... .”

ඇදහිළි හා විශ්වාස පිළිබඳ ව උදා 2 - ලකුණු 02

විස්තර කර ඇත්නම් - ලකුණු 02

**ලකුණු 04**


(iii). “කෝළම් නාටකය මඟින් සමාජ විවරණයක් සිදු වේ.”මෙම කියමන පැහැදිළි කරන්න.

- පවුල් සංස්ථාව පවත්වාගෙන යාම, විවාහයේ දී වයස් පරතරය හා බීමත්කමින් රාජකාරී කිරිමෙන් ඇතිවන ගැටළු
  - උදා - ජස ලෙංචිනා
- කාන්තාවන්ට ලොල් බව, බීමත් කම, සාධාරණත්වය ඉටු නොකිරීම,රාජකාරීත්ව නිසි ලෙස ඉටු නොකිරීම.
  - උදා - මුදලී

සමාජ විවරණයක් කර ඇත්නම් ලකුණු 04

**මුළු ලකුණු 12**

06) .පහත දැක්වෙන රූප ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



A



B




C

(i). A රූපයේ දැක්වෙන නර්තන සම්ප්‍රදාය සඳහන් කර නර්තන අංග තුනක් නම් කරන්න.

භරත නර්තන සම්ප්‍රදාය

- අලාරිප්පු
- ජතිෂ්වරම්
- ශබ්දම්
- වර්ණම්
- පදම්
- තිල්ලානා
- ශ්ලෝකම්

නර්තන සම්ප්‍රදාය නම් කිරීමට ලකුණු 01
නර්තන අංග තුනක් නම් කිරීමට ලකුණු 03
**ලකුණු 04**

(ii). B රූපයේ දැක්වෙන නර්තන සම්ප්‍රදාය නම්කර , එය ආහාර්ය අභිනයෙන් පොහොසත් බවට කරුණු ඉදිරිපත් කරන්න.

කතකලි නර්තන සම්ප්‍රදාය

- ඉන්දියානු නර්තන සම්ප්‍රදායන් අතරින් ආහාර්ය අභිනය අතින් පොහොසත්ම නර්තන සම්ප්‍රදාය බව
- විචිත්‍ර හා සංකීර්ණ වේශ නිරූපණ ක්‍රම භාවිත කරන බව
  (මිනික්කු, පච්චා, කත්ති, තාඩි, කාරි, ඩෙප්පු)
- වේෂ නිරූපණය කරන ශිල්පියා "පත්තුකාරන්" ලෙස හඳුන්වන බව
- විචිත්‍රවත් රංග වස්ත්‍ර භාවිත කරන බව
- ක්‍රීටම් (ඔටුනු) නම් හිස් පළඳනාවක් පළඳින බව

නර්තන සම්ප්‍රදාය නම් කිරීමට ලකුණු 01
කරුණු ඉදිරිපත් කර ඇත්නම් ලකුණු 03
**ලකුණු 04**

iii. C රූපයේ දැක්වෙන කලා කෘතිය නම් කර, එහි සුවිශේෂ ලක්ෂණ පැහැදිලි කරන්න.

කරදිය මුද්‍රා නාට්‍ය

- දේශීය නර්තන සම්ප්‍රදායන් හා විදේශීය නර්තන සම්ප්‍රදායන්වල ආභාෂය ලබා ඇති බව
  (උඩරට හා පහතරට නර්තන සම්ප්‍රදායන් හා භාරතීය නර්තන සම්ප්‍රදායන් මෙන්ම බටහිර බැලේ නාට්‍ය ආභාෂය ලබා ඇත)
- දේශීයත්වයට නැඹුරු වූ පසුබිම් සංගීතයක් යොදාගෙන ඇති බව
- ධීවර ජනතාවගේ ජීවන රටාව මතුවන ආකාරයේ නාදමාලා යොදා ගෙන ඇති බව
  (ජීවිතයත් මහ මුහුද වගේ ........)
- දේශීයත්වයට හා ධීවර චරිතවලට ගැලපෙන රංග වස්ත්‍ර යොදාගෙන ඇති බව
- පරිසරයේ ගති ස්වභාවයන් මතුවන ලෙස පසුබිම් අලංකරණ යොදාගෙන ඇති බව

කලා කෘතිය නම් කිරීමට ලකුණු 01
සුවිශේෂ ලක්ෂණ පැහැදිලි කර ඇත්නම් ලකුණු 03
**ලකුණු 04**
**මුළු ලකුණු 12**

07) .

(i). නර්තන කලාව හැදෑරීමෙන් අත්පත් කර ගත හැකි **මානවීය ගුණාංග** දෙකක් ඇගයීමට ලක් කරන්න.

- රස වින්දනය
- ඉවසීම
- කලාකෘති ඇගයීම
- වැඩිහිටියන්ට සැළකීම
- සමඟිය
- සහජීවනය
- සාමූහික බව

ගුණාංග දෙකක් ඇගයීමට ලක් කර ඇත්නම් **ලකුණු 04**

(ii). නර්තන කලාවේ උන්නතියට වේදිකා ප්‍රසංගවල දායකත්වය පැහැදිළි කරන්න.

- විවේකය ඵලදායී ලෙස ගත කිරීම.
- වින්දන ක්ෂේත්‍රය දියුණු කිරීමට
- ආර්ථිකය ශක්තිමත් වීම
- සන්නිවේදන මාධ්‍ය ලෙස නර්තනය යොදා ගනිමින් පණිවිඩයක් ලබා දීම

වේදිකා ප්‍රසංගවල දායකත්වය පැහැදිළි කිරිම **ලකුණු 04**

(iii). අන්තර්ජාතික වශයෙන් නර්තන කලාව හැදෑරීමේ වැදගත්කම විස්තර කරන්න.

- විවිධ රටවලට නර්තන කලාව හැදෑරීමට අවස්ථාව ලැබීම.
- අන්‍ය සංස්කෘති හඳුනා ගැනීම හා සහසම්බන්ධතා පැවැත්වීමට අවස්ථාව ලැබීම.
- අන්තර්ජාතික උළෙලවල් සඳහා නර්තන කණ්ඩායම් නියෝජනය වීම
- විදෙස් රටවලින් විවිධ උපාධි පාඨමාලා හැදෑරීමට අවස්ථාව ලැබීම.

කලාව හැදෑරීමේ වැදගත්කම විස්තර කිරිම **ලකුණු 04**

**මුළු ලකුණු 12**

*****